බැංකු සේවාවන්

**අමානා බැංකුවේ අන්තර්ජාල බැංකුකරණ පහසුකම**

| | |
|---|---|
| සේවාව මඟින් ලැබෙන ප්‍රතිලාභ | • අන්තර්ජාල බැංකුකරණ පහසුකම සඳහා ස්වයං ලියාපදිංචිය<br>• ඔබගේ තැන්පතු සහ ණය පහසුකම් සියල්ල සඳහා ප්‍රවේශ වීමේ හැකියාව<br>• එක් වරක් පමණක් සිදුකරන මුදල් මාරු කිරීම් සහ ප්‍රතිලාභීන් කළමනාකරණය ඇතුළුව අභ්‍යන්තර හා බාහිර මුදල් මාරු කිරීමේ හැකියාව<br>• බිල්පත් ගෙවීම<br>• නව කාලීන ආයෝජන ගිණුම්<br>• ස්ථාවර නියෝග ලබාදීමේ හැකියාව<br>• ගනුදෙනුවලට අදාළ ලදුපත් යැවීමේ හෝ බාගත කිරීමේ හැකියාව<br>• අන්තර්ජාල බැංකුකරණයේදී ජෛවමිතික ප්‍රවේශය (Biometric Login) සහ එක්වරක් පමණක් භාවිතා කළ හැකි මුර පද (OTP) ඇතුළුව ඉහළම තලයේ ආරක්ෂාවක් |
| යෙදුම භාවිතා කරන ආකාරය | • බැංකුවේ ලියාපදිංචි කර ඇති ජංගම දුරකථන අංකය සහ ඊමේල් ලිපිනය භාවිතයෙන් යෙදුම බාගත කරගෙන ඒ තුළින් ඔබටම ලියාපදිංචි විය හැක.<br>• ඔබේ ඊමේල් ලිපිනය ලියාපදිංචි කිරීම් සඳහා 0117 756 756 අමතන්න.<br>• ඔබේ දුරකථන අංකය ලියාපදිංචි කිරීම සඳහා ළඟම පිහිටි ශාඛාව වෙත පැමිණෙන්න.<br>• බද්ධ ගිණුම් හිමියන් ලියාපදිංචිය සඳහා මෙතැන ක්ලික් කරන්න.<br><br>වැඩිදුර තොරතුරු සඳහා අන්තර්ජාල බැංකුකරණ වෙබ් අඩවියට පිවිසෙන්න. |
| පෞද්ගලිකත්ව ප්‍රතිපත්ති ප්‍රකාශනය | අමානා බැංකුවේ ජංගම යෙදුමට අදාළ පෞද්ගලිකත්ව ප්‍රතිපත්ති ප්‍රකාශනය සඳහා මෙතැන ක්ලික් කරන්න. |

| | |
|---|---|
| බැංකුවේ ජංගම යෙදුම සහ වෙබ් ද්වාරය හරහා සේවාවන් සඳහා අයදුම් කිරීම | ඔබේ පහසුව උදෙසා මෙන්ම ඔබට වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබාදීම උදෙසා අමානා බැංකුවට කෙටි පණිවිඩ යොමුකිරීමේ සේවාවන් හඳුන්වා දී තිබේ. ඔබ කළ යුත්තේ ජංගම යෙදුමේ 'Email Us' කොටස ක්ලික් කර ඔබේ ඉල්ලීම අප වෙත යොමුකිරීම පමණි. වැඩිදුර තොරතුරු සඳහා මෙතැන ක්ලික් කරන්න.<br>පහත ද්වාරයන් වෙත පිවිසීමට ක්ලික් කරන්න.<br>• ආයතනික වෙබ් ද්වාරය<br>• පෞද්ගලික වෙබ් ද්වාරය |
| ගාස්තු | දැනට ක්‍රියාත්මක වන ගාස්තු අපගේ නිල වෙබ් අඩවියෙහි දක්වා තිබේ:<br>https://www.amanabank.lk/tariff-services.html |

## අමානා බැංකුවේ WhatsApp බැංකුකරණ පහසුකම

| | |
|---|---|
| සේවාවෙහි ස්වභාවය | WhatsApp හරහා 'Hi' ලෙස ටයිප් කිරීම මඟින් WhatsApp බැංකු සේවාවන් ලබාගැනීම ආරම්භ කළ හැක. මෙය ඔබට ඕනෑම වේලාවක ඕනෑම ස්ථානයක සිට සුරක්ෂිත ලෙස බැංකු ගනුදෙනු සිදුකිරීමට ලැබෙන අවස්ථාවකි. ඔබේ පහසුව තකා මෙය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම ක්‍රියාත්මක වේ.<br><br>ලබාගත හැකි සේවාවන්<br><br>1. ගිණුමේ ශේෂය පරීක්ෂා කිරීම<br><br>ඔබේ ජංගම ගිණුම්, ඉතුරුම් ගිණුම් සහ කාලීන ආයෝජනවල ශේෂයන් ක්ෂණිකව පරීක්ෂා කරන්න.<br><br>2. ලබාගෙන ඇති මූල්‍ය පහසුකම් සම්බන්ධ තොරතුරු<br><br>බැංකුව වෙතින් ලබාගෙන ඇති මූල්‍ය පහසුකම් සම්බන්ධ තොරතුරු පරීක්ෂා කරන්න.<br><br>3. මුදල් මාරු කිරීම/ බිල්පත් ගෙවීම |

| | |
|---|---|
| | ගිණුමකින් ගිණුමකට මුදල් මාරු කිරීම සහ බිල්පත් ගෙවීම ඇතුළු සේවාවන් රැසක් සඳහා අමානා බැංකුවේ ඩිජිටල් පදනම් වෙත සෘජු සබැඳි (Links) ලබාගන්න.<br>4. ඩෙබිට් කාඩ්පත් දීමනා<br>සුවිශේෂී ඩෙබිට් කාඩ්පත් දීමනා, හවුල්කරුවන් පිරිනමන වට්ටම් සහ උත්සව සමයන් වෙනුවෙන් හඳුන්වා දෙන ප්‍රවර්ධන වැඩසටහන් ආදිය පිළිබඳ නවතම තොරතුරු දැනගන්න. |
| සුදුසුකම් | • අමානා බැංකුවේ ලියාපදිංචි දුරකථන අංකය සහිත සියලුම ගනුදෙනුකරුවන්ට මේ සඳහා අයදුම් කළ හැක.<br>• ආරක්ෂාව සහ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම සඳහා සේවාවන් ලබාගත හැකි වන්නේ ඔබේ අමානා බැංකු ගිණුමට සම්බන්ධ දුරකථන අංකය හරහා පමණි. |
| ප්‍රතිලාභ | • End-to-end encrypted පණිවිඩ හරහා වඩාත් සුරක්ෂිත ප්‍රවේශයක්<br>• සති අන්ත සහ නිවාඩු දින ඇතුළුව සෑම දිනකම පැය 24 පුරා ක්‍රියාත්මකයි<br>• අත්‍යවශ්‍ය ගිණුම් තොරතුරු සඳහා ඉක්මනින් සහ පහසුවෙන් ප්‍රවේශ වීමේ හැකියාව<br>සේවාව භාවිතා කිරීම සඳහා අමතර ගාස්තු නැත.<br>• ඩිජිටල් බැංකු ගනුදෙනු පහසුවෙන් සිදුකිරීම සඳහා සබැඳි (Links)<br>• ආරක්ෂාව සඳහා කෙටි පණිවිඩ මඟින් එක්වරක් පමණක් වලංගු මුරපද (OTP) එවීම |
| සේවාව ලබාගත හැකි ආකාරය | 1. **+94 70 775 6756** අංකය ඔබේ සම්බන්ධතා ලැයිස්තුවේ **save** කරගන්න. නැතිනම් පිවිසෙන්න: **https://bit.ly/AmanaWAB** |

| | |
|---|---|
| | 2. WhatsApp විවෘත කර Save කළ අංකයට Hi යනුවෙන් පණිවිඩයක් යවන්න.<br>3. චැට් එක තුළ දිස්වෙන උපදෙස් අනුගමනය කරන්න.<br>4. ආරම්භයේදී භාෂාව තෝරගෙන නියමයන් හා කොන්දේසිවලට එකඟ වීමෙන් පසුව ඊළඟ චැට් කිරීම්වලදී එය නැවත කළ යුතු නොවේ. |

**Amana Bank Connect සේවාව**

| | |
|---|---|
| සේවාව පිළිබඳ හැඳින්වීමක් | **Amana Bank Connect** යනු අමානා බැංකුවේ සේවාවන් වෙත පිවිසෙන ඩිජිටල් ද්වාරයකි. බැංකුවේ සේවාවන් පිළිබඳව තොරතුරු ලබාදීම, සහය සේවාවන් පිරිනැමීම සහ බැංකු සේවාවන් තවදුරටත් පහසු කරන මෙවලම් භාවිතා කිරීමට අවස්ථාව උදාකර දීම සඳහා මෙය සැලසුම් කර ඇත. ඔබ දැනටමත් අමානා බැංකුවේ ගනුදෙනුකරුවෙකු වුවත්, නැතිනම් එහි සේවාවන් පිළිබඳ තොරතුරු සොයන්නෙකු වුවත්, ඔබට ඇති පහසුම විසඳුම වන්නේ ඔබට අවශ්‍ය සියලු තොරතුරු හා පහසුකම් එකම යෙදුමක් **(App)** හරහා ලබාදෙන **Amana Bank Connect** සේවාවයි. |
| සේවාවෙහි ස්වභාවය | • අන්තර්ජාලය ඔස්සේ ගිණුමක් විවෘත කිරීම<br>ඔබේ දුරකථනයෙන් ඉතාමත් පහසුවෙන් ගිණුමක් විවෘත කර අමානා බැංකුව හා සම්බන්ධ වන්න.<br><br>• අප අමතන්න<br>ඔබේ අවශ්‍යතාව අනුව සැණින් අමානා බැංකුවේ අදාළ අංශය අමතන්න. Search කිරීම අවශ්‍ය නැත.<br><br>• **'Your Bank'** අන්තර්ජාල බැංකුකරණ ප්‍රවේශය<br>අන්තර්ජාල බැංකුකරණ වෙබ් ද්වාරය ඔස්සේ පහසුවෙන් ගිණුමකින් ගිණුමකට මුදල් මාරු කිරීම, |

| | |
|---|---|
| | බිල්පත් ගෙවීම සහ ගිණුම් කටයුතු කළමනාකරණ කරගැනීම<br><br>• ආයතනික අන්තර්ජාල බැංකුකරණ ප්‍රවේශය<br>ව්‍යාපාරික හා ආයතනික බැංකුකරණ ගනුදෙනුකරුවන්ට අමානා බැංකුවේ අන්තර්ජාල බැංකු සේවා වෙබ් අඩවියට පිවිසී සේවාවන් ලබාගත හැක.<br><br>• මූල්‍ය පහසුකම් සඳහා අයදුම් කිරීම<br>මූල්‍ය පහසුකම් ගැන තොරතුරු දැනගන්න. මාර්ගගතව (Online) අයදුම් කරන්න.<br><br>• ඩෙබිට් කාඩ්පත් දීමනා පරීක්ෂා කිරීම<br>අමානා බැංකුවේ ඩෙබිට් කාඩ්පත් හිමියන් වෙනුවෙන් හඳුන්වා දී ඇති නවතම දීමනා ගැන දැනගන්න.<br><br>• **WhatsApp** බැංකුකරණ පහසුකම<br>. WhatsApp බැංකුකරණ පහසුකම ඔස්සේ ගිණුම් ශේෂය සහ මූල්‍ය පිළිබඳ පහසුකම් තොරතුරු ඇතුළු බොහෝ දෑ දැනගන්න.<br><br>• ශාඛා සොයාගැනීම<br>Branch Locater තුළින් ඔබට ළඟම පිහිටි අමානා බැංකු ශාඛාව හෝ ATM යන්ත්‍රය සොයාගන්න.<br><br>• අමානා බැංකුවේ රැකියා අවස්ථා<br>අමානා බැංකුවේ නවතම රැකියා අවස්ථා පිළිබඳව තොරතුරු දැනගන්න.<br><br>• ඔබේ අදහස් හා යෝජනා<br>ඔබේ අදහස් අපට බෙහෙවින් වැදගත්ය. එබැවින් Feedback කොටස ඔස්සේ ඔබේ අදහස්, යෝජනා හෝ චෝදනා අප වෙත යොමුකරන්න.<br><br>• **Orphan Care** වෙබ් අඩවිය |

| | |
|---|---|
| | වටිනා මෙහෙවරකට ඔබේ දායකත්වය ලබාදෙන්න. වැඩිදුර තොරතුරු සහ පරිත්‍යාග සඳහා යෙදුමේ දක්වා ඇති Orphan Care කොටසට පිවිසෙන්න. |

## බැංකු සේවාවන්

## SMS දැනුම්දීම් සහ විද්‍යුත් ගිණුම් ප්‍රකාශන සේවාවන්

| | |
|---|---|
| SMS දැනුම්දීම් (SMS Alerts) සේවාව සහ එහි ස්වභාවය | අමානා බැංකුවේ SMS දැනුම්දීම් (SMS Alerts) සේවාව ලබාගෙන, ඔබගේ ගිණුම හරහා සිදුවන ගනුදෙනු ගැන අවධානයෙන් පසුවන්න. මෙම සේවාව මඟින්, ඔබගේ ගිණුම හරහා යම් ගනුදෙනුවක් සිදු වූ සැණින් ඒ බව ගිණුමේ නවතම ශේෂයද සමඟින් ඔබ වෙත දැනුම් දෙනු ලැබේ.<br>• ඩෙබිට් කාඩ්පත් ගනුදෙනු<br>• ලාභ බැර කිරීම<br>• මුදල් තැන්පත් කිරීම සහ ආපසු ලබාගැනීම<br>• අභ්‍යන්තර ප්‍රේෂණ<br>• වැටුප් බැරවීම<br>• ගිණුම තුළට හෝ ඉන් පිටතට මුදල් මාරු කිරීම<br>• චෙක්පත් නිෂ්කාශනය වීම සහ බැරවීම<br>• ස්ථාවර නියෝග ගනුදෙනු<br>• බිල්පත් ගෙවීම් පිළිබඳ දැනුම්දීම |
| විද්‍යුත් ගිණුම් ප්‍රකාශන සේවාව සහ එහි ස්වභාවය | දැන් ඔබට නිවසේ සිටම අමානා බැංකුවේ විද්‍යුත් ගිණුම් ප්‍රකාශන සේවාව සඳහා ලියාපදිංචි විය හැක. |
| අයදුම් කළ හැකි ආකාරය | SMS දැනුම් දීම් සහ විද්‍යුත් ගිණුම් ප්‍රකාශන සේවාවන් සඳහා අයදුම් කිරීමට මෙතැන ක්ලික් කරන්න. |

| | |
|---|---|
| ප්‍රතිචාර සහ පැමිණිලි | ඔබගේ ප්‍රතිචාර සහ පැමිණිලි පැය 24 පුරා ක්‍රියාත්මක අපගේ පාරිභෝගික විසඳුම් මධ්‍යස්ථානය වෙත යොමුකරන්න. අපගේ නියෝජිතයන් ඔබට අවශ්‍ය සහයෝගය නොපමාව ලබාදෙනු ඇත.<br><br>පාරිභෝගික විසඳුම් මධ්‍යස්ථානයේ දුරකථන අංකය: +94 11 7 756 756<br>ඊමේල් : info@amana.lk \| feedback@amana.lk<br><br>ඔබගේ විමසීම් අපගේ වෙබ් අඩවිය හරහා යොමුකරන්න: www.amanabank.lk<br><br>කෙසේ නමුත් ඔබගේ අවශ්‍යතාව ඉටු නොවූයේ නම් ඒ බව ලිපියක් හෝ විද්‍යුත් ලිපියක් (ඊමේල්) මඟින් අප වෙත දැනුම් දෙන්න:<br><br>කළමනාකරු - සේවා තත්ත්ව සහතිකකරණ<br>අමානා බැංකුව අංක 485, ගාලු පාර, කොළඹ 03<br>ඊමේල්: servicequality@amana.lk |
| | ඉහත සඳහන් ක්‍රම මඟින් ඔබගේ අවශ්‍යතාව ඉටු නොවූයේ නම්, ඔබට ස්වාධීන මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයාගේ සේවාව ලබාගත හැක.<br><br>මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලයේ සම්බන්ධතා තොරතුරු පහත දැක්වේ.<br><br>මූල්‍ය ඔම්බුඩ්ස්මන්,<br>අංක 01, බෙතෙස්ඩා පෙදෙස, මිලාගිරිය, කොළඹ 04<br>දුරකථන: + 94 11 2595624 ෆැක්ස්: +94 11 2595625 |